# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2073/40 - 2018 මැයි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට පොල්ගහවෙල - පොතුහැර අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ හඳුගල ඝණ මීටර් 800ක භූගත ජල ටැංකිය හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම්වල නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 24 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1378

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 907 වලගම්මුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හඳුගල ගමේ පිහිටි වැලිකුඹුරේ හේන සහ පාර අද්දර හේන නමැති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 43.88ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් දෙක :

කැබලි අංක : 01

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඒ. සිරිසේන මයාට අයිති කුඹුර ; |
| *නැගෙනහිරට* | : | අංක 02 ඉඩම් කොටස ; |
| *දකුණට* | : | බුලුගොල්ල - දොඹේමඩ මාර්ගය ; |
| *බටහිරට* | : | බී. ආර්. අප්පුහාමි මහතා හිමිකම් කියන කෝම්බෙ වත්ත නොහොත් කෝන්ගහමුල වත්ත |


1A - G 27777— 40 (2018/05)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කැබලි අංක : 02

*උතුරට* : ඒ. සිරිසේන මයාට අයිති කුඹුර ;
*නැගෙනහිරට* : අංක 03 ඉඩම් කොටස ;
*දකුණට* : බුලුගොල්ල - දොඹේමඩ මාර්ගය ;
*බටහිරට* : අංක : 01 ඉඩම් කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*

01. එස්. එම්. වී. ඩී. මාලා මිය,
අංක 233,
පන්සල පාර,
හඳුගල, පොතුහැර

06 -661

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ පොම්ප ක්‍රියාකරුවන්ගේ නිල නිවාස ඉදිකිරීම් සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 28 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1377

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 148 - අමන්දොළුව ග්‍රාම නිලධාරී වසමේ අමන්දොළුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඒ. ඕගස්ටීනස් ප්‍රනාන්දු මහතා විසින් පිළිවෙල කරන ලද අංක 10200/2017 හා 2017.07.24 දිනැති පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වෙන දවටගහවත්ත නමැති ඉඩමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.03288 (පර්චස් 13)ක් පමණ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : නගර සභා පාර ;
*නැගෙනහිරට* : අංක 1061 පිඹුරේ කැබලි අංක 18 දරන ඉඩම ;
*දකුණට* : කේ. එංගල්තිනාහාමි හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : අංක 1061 පිඹුරේ කැබලි අංක 16 දරන ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*

බී. සිඩ්නි ඇන්ටනි මහතා,
අංක 141/2,
ලියනගේ මුල්ල,
සීදුව.

06 -662

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ජා-ඇල හා ඒකල මළනල පද්ධතිය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංක 06 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 28 වැනි දින,<br>
අංක 35, ලක්දිය මැඳුර,<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/1/1375

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 205B, මහවත්ත, ග්‍රාම නිලධාරී වසමේ ඒකල ඉසුරු උයන ගමේ පිහිටි සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ කෘෂ්වත්ත නැමැති ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඉසුරු උයන පාර ; |
| *නැගෙනහිරට* | : | යාබඳ නිවාස ඉඩම ; |
| *දකුණට* | : | හිස්බිම් කොටස් ; |
| *බටහිරට* | : | ගුරුපාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : එච්. එස්. සේනාධීර මහතා,<br>
අංක 29,<br>
ඉසුරු උයන,<br>
කොටුගොඩ.

06 -663

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.